www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2019

## කතෝලික ධර්මය

08 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

### I කොටස

- අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශුද්ධාත්මයාණන්ගේ සුබාරංචිය ලෙස හැඳින්වෙන්නේ,

(1) මතෙව් සුබාරංචිය (2) ජොහාන් සුබාරංචිය
(3) ලූක් සුබාරංචිය (4) මාක් සුබාරංචිය

02. ධනයට ලොල්වීමට එරෙහිව ජේසුස් වහන්සේ දේශනා කළ උපමාව වන්නේ,

(1) අකීකරු පුත්‍රයා පිළිබඳ උපමාව. (2) පොහොසත් තරුණයා පිළිබඳව උපමාව.
(3) ධනපතියා සහ ලාසරස් පිළිබඳ උපමාව. (4) පොහොසත් මෝඩයා පිළිබඳ උපමාව.

03. දාවිත් රජතුමාගෙන් ලෝක ගැළවුම්කරුවාණන් පැමිණෙන බව දාවිත් රජතුමාට දැන්වූයේ,

(1) නාතාන් දිවැසිවරයා ය. (2) යෙසායා දිවැසිවරයා ය.
(3) මීකා දිවැසිවරයා ය. (4) ජෝනා දිවැසිවරයා ය.

04. ස්නාවක ජොහාන් තුමා විසින් ප්‍රසිද්ධියේ ම වරද පෙන්වා දෙනු ලැබුවේ කාගේද?

(1) හෙරෝද් පිලිප්ගේ ය. (2) හෙරෝද් අග්‍රිපාගේ ය.
(3) මහ හෙරෝද්ගේ ය. (4) හෙරෝද් ඇන්ටිපස්ගේ ය.

05. එම්බා පොළොං වංශය එන්න තිබෙන උදහසින් පලා යන්න නුඹලාට අවවාද කළේ කවරෙක්ද යනුවෙන් ස්නාවක ජොහාන් තුමා පැවසුවේ,

(1) භේවායන්ට (2) ප්‍රභූන්ට
(3) අයකැමියන්ට (4) සාමාන්‍ය ජනතාවට

06. ශුභාරංචි ග්‍රන්ථවල ඉතාමත් වැදගත් කොටස වන්නේ,

(1) පාස්කු අභිරහස (2) ක්‍රිස්තුස් වහන්සේගේ මරණය
(3) ක්‍රිස්තුස් වහන්සේගේ උපත (4) අන්‍යාරූප විලාස වීම.

07. ''මා සිහි කිරීම පිණිස මෙය කරන්නැයි'' ජේසුස් වහන්සේ පැවසුවේ,

(1) කුරුස ගසේ දී (2) බෞතිස්ම ස්නාපනයේ දී
(3) අන්තිම රාත්‍රී භෝජනයේ දී (4) ශ්‍රාවකයන් තෝරා ගැනීමේ දී



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

08. ජේසුස් වහන්සේගේ වචනවල හා දේශනාවල හරය වූයේ,

(1) දේව රාජ්‍යයේ උදාවයි. (2) මනුෂ්‍යයාගේ උතුම්කමයි.

(3) දෙවියන්ගේ ප්‍රේමයයි. (4) කිතුනු දිවියේ පැවැත්මයි.

09. අපෝස්තුළුවරුන්ගේ කාලයේ සිට පැවත ගෙන ආ පිළිවෙත් දෙක වූයේ,

(1) රෝගීන්ගේ ආලේපය හා දිව්‍ය සත්ප්‍රසාදය

(2) පාපොච්චාරණය හා පූජකවරයයි.

(3) පූජකවරය හා ආශිර්වාදකාර බන්ධනයයි.

(4) ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධියාලේපයයි.

10. විශ්වාසයේ සත්‍යතා තේරුම් ගැනීමට අපට දානය කරනු ලබන ශුද්ධාත්ම දීමනාවකි.

(1) ධෛර්යය (2) ප්‍රඥාව

(3) දැනගැන්ම (4) තේරුම් ගැනීම

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

11. ජේසුස් වහන්සේ පාළුකරයේ දින .................................................................................. යාච්ඤා කළ සේක.

12. ජේසුස් වහන්සේගේ උපත ............................................................... ආනන්දජනක පුවතක් බව දේව දූතයෝ ප්‍රකාශ කළහ.

13. ................................................................................................................ පරීක්ෂා ජය ගැනීමට සූදානම් විය යුතුය.

14. ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් දානය කරන ශුද්ධාත්ම ඵල ................................................................. කි.

15. දෙවියන් වහන්සේට "අබ්බා පියාණනි" යනුවෙන් ඇමතීමට හැකි වන්නේ ......................................... තුළිනි.

( 12, අභිවෘද්ධියාලේපය, යාච්ඤාවෙන්, 40 ක්, සියලු ජනතාවට, 07 ක් )

- **අංක 16 - 20 දක්වා නිවැරදි වාක්‍යයට (✓) ලකුණද, වැරදි වාක්‍යයට (X) ලකුණද යොදන්න.**

16. ජේසුස් වහන්සේ සිදුකල ප්‍රාතිහාර්ය වර්ග පහකි. ( )

17. මන්නා භෝජනය දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණයකි. ( )

18. ශාරීරික සූදානම යනුවෙන් අදහස් කරන්නේ පාපයෙන් තොර වීමයි. ( )

19. ඕනෑම පියතුමෙකුට අභිවෘද්ධියාලේපය දානය කළ නොහැක. ( )

20. අපගේ ජීවිතයේ ප්‍රාතිහාර්ය අත් දැකීමට නම් විශ්වාසයෙන් යාච්ඤා කළ යුතුය. ( )



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (i) ලූක් සුපුවතේ කතුවරයා දක්ෂතා දැක්වූ ක්ෂේත්‍ර 02 ක් නම් කරන්න.

(ii) යහපත් සමරිකානුවරයාගේ උපමාවේදී ඇගයීමට ලක් කෙරෙන ජාතිය නම් කරන්න.

(iii) ලූක් තුමා පමණක් සඳහන් කරන උපමා 02 ක් ලියන්න.

(iv) අභිවෘද්ධියාලේපයේදී රාජගුරු ප්‍රසාදීන් වහන්සේ අපේක්ෂකයාගේ නළල ක්‍රිස්මා තෛලයෙන් ආලේප කර පවසන්නේ කුමක්ද?

(v) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සූදානම් වන ආකාර 02 ක නම් කරන්න.

(vi) ස්වර්ග රාජ්‍යය පිළිබඳව කියැවෙන උපමා දෙකක් නම් කරන්න.

(vii) මාරුත දමනයේ ප්‍රාතිහාර්යයෙන් පෙන්වනු ලබන කරුණු 02 ක් ලියන්න.

(viii) අපගේ ජීවිතවල ප්‍රාතිහාර්ය අත්දැකීමට නම් කළ යුතු කාර්යයන් දෙකක් ලියන්න.

(ix) දිව්‍ය පූජාවෙන් පරිබාහිරව දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට අවසර ඇති අවස්ථා 02 ක් නම් කරන්න.

(x) ස්නාවක ජොහාන් තුමා උපත ලබා අටවන දිනයේ දී සිදු කළ වත්පිළිවෙත් 02 ක් නම් කරන්න.

(ල. 2 x 10 = 20)

02. (i) ලූක් සුබාරංචියේ සඳහන් කාන්තා චරිත 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) ලූක් සුබාරංචියේ පණිවුඩ 03 ක් ලියන්න. (ල. 03)

(iii) එම එක් පණිවිඩයක් මගින් ඔබේ ජීවිතය සාර්ථක කර ගන්නා ආකාරය ලියා දක්වන්න. (ල. 05)

03. (i) ජේසුස් වහන්සේගේ බෞතිස්මයේ දී අහසින් නික්මුණු හඬ කුමක්ද? ලියා දක්වන්න. (ල. 02)

(ii) ජේසුස් වහන්සේ පාළුකරයේ දී මුහුණ දුන් පරීක්ෂා 03 ක් ලියන්න. (ල. 03)

(iii) ඔබ ජීවිතයේ දී මුහුණ දුන් එක් පරීක්ෂාවක් නම් කර එය ජයගත් අවස්ථාවක් නම් කරන්න. (ල. 05)

04. (i) ප්‍රාතිහාර්යයක් යනු කුමක්ද? (ල. 02)

(ii) ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්ය වර්ග 03 ක් ලියන්න. (ල. 03)

(iii) ලෙඩ රෝගවලින් පෙළෙන අයට ඉක්මන් සුවය පතා යාච්ඤාවක් ලියන්න. (ල. 05)

05. (i) දිව්‍ය සත්ප්‍රසාදයේ පූර්ව සලකුණු 02 ක් ලියන්න. (ල. 02)

(ii) දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(iii) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ගෞරවයෙන් ලබා ගැනීමට ඔබට කළ හැකි දේවල් 05 ක් ලියන්න. (ල. 05)

06. (i) ප්‍රසාද ස්නාපනයෙන් ඇති වූ විශ්වාසය පරිණත කරනු ලබන්නේ කුමන ප්‍රසාද නිධානයෙන්ද?(ල. 02)

(ii) ශුද්ධාත්මයාණන් වහන්සේ සඳහා පුරාණ ගිවිසුමේ භාවිත කළ නම් 03 ක් ලියන්න. (ල. 03)

(iii) ප්‍රසාද ස්නාපන ලබා ඇති කිතුනු දරුවෙකු වශයෙන් ඔබට පැවරී ඇති වගකීම් 05 ක් ලියන්න. (ල. 05)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk